| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර පරීක්ෂණය - 2025 |
| 6 ශ්‍රේණිය | **නර්තනය** |

නම/ විභාග අංකයඃ ......................................... කාලය පැය 2 යි

## I කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **අංක 01 - 05 දක්වා ප්‍රශ්න සඳහා නිවැදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1. පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වන්නේ,
   - i. දවුල
   - ii. ගැටබෙරය
   - iii. දෙවොල් බෙරය
   - iv. උඩැක්කිය
2. උඩරට පා සරඹ අතරින් දෙවන පා සරඹයේ සරඹ නාමය වන්නේ,
   - i. අඩිය
   - ii. දැඩිය
   - iii. දෙපැති අඩිය
   - iv. තුන් අඩිය
3. දේශීය නර්තන සම්ප්‍රදායයන්ගේ මූලික ඉරියව්ව වන්නේ,
   - i. මණ්ඩිය
   - ii. නමස්කාරය
   - iii. දණ්ඩි සරඹ
   - iv. පා සරඹ
4. උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ඇඳුම් කට්ටලය වන්නේ,
   - i. තෙල්මෙ ඇඳුම
   - ii. වෙස් ඇඳුම් කට්ටලය
   - iii. පබළු ඇඳුම් කට්ටලය
   - iv. වඩිග පටුන ඇඳුම් කට්ටලය
5. තෛපොංගල් දිනයේදී වර්ණවත් කළ සහල් පිටි, කහ කුඩු යොදා ගනිමින් පොළව මත සිදු කරන විචිත්‍රවත් රටා නිර්මාණය වන්නේ,
   - i. පොංගල් බත
   - ii. කෝලම් රටා
   - iii. මාට්ටුප් පොංගල්
   - iv. පුන්කලස

- **පහත සඳහන් 6 - 10 දක්වා වාක්‍ය හරි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

6. කුද ගත ගත දොම් සුළු තනි තිතට අයත් බෙර පදයකි. (    )
7. පරිසරයෙන් ඇසෙන විවිධ මිහිරි නාද නිසා සිතේ කණස්සල්ල ඇති වේ. (    )
8. නමයතා අභ්‍යාසවල යෙදීම නිසා මානසික හා කායික සුවය ඇති වේ. (    )
9. හනුමා වන්නමෙන් වඳුරෙක-ගේ හැසිරීම් රටාව පිළිබඳ කියවේ. (    )
10. හේවිසි වාදනය සඳහා දවුල, තම්මැට්ටම හා හොරණෑව යොදා ගැනේ. (    )

- **ප්‍රශ්න අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී වරහන් තුළ දී ඇති පිළිතුරු වලින් තෝරා හිස්තැනට සුදුසු වචනය ලියන්න.**

**(ලී කෙළි / මහනුවර / ගැට බෙරය / සරල / තාලම්පට)**

11. ඇම්බැක්කේ දේවාලයේ ලී බාල්කයක ………………………….. නැටුමක කැටයමක් දක්නට ඇත.
12. ගැමි නැටුම්වල දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයකි ………………………….. බව.
13. පා සරඹ නැටීමේදී තාල තැබීම සඳහා ………………………….. යොදා ගනී.
14. සම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩයකි. …………………………..
15. උඩරට නර්තන සම්ප්‍රදාය ………………………….. ප්‍රදේශයේ ප්‍රචලිතව ඇත.

- **A කොටසේ දැක්වෙන වචනයට ගැළපෙන වචනය B කොටසින් තෝරා යා කරන්න.**

| A කොටස | B කොටස |
|---|---|
| 16. පහතරට නර්තන සම්ප්‍රදාය | කස්තිරමකි |
| 17. දෙවන ගොඩ සරඹය | තෙල්මෙ |
| 18. තත්ජිත් තොං නං තා | ලී කෙළි |
| 19. කෝලාට්ටම් | දැඩිය |
| 20. තාලම්පට | තිත් තෙයි |

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03කට පමණක් පිළිතුරු සපයන්න.**

1.
   i. මාත්‍රා දෙකේ තාලයට අයත් බෙර පදයක් ලියන්න. (ල. 2)
   ii. අතීතයේදී පා සරඹ නැටීමේදී මණ්ඩිය සකසා ගැනීමට ප්‍රයෝජනයට ගත් උපකරණය නම් කරන්න. (ල. 2)
   iii. මූලික චලන වර්ග නම් කරන්න. (ල. 2)
   iv. පා සරඹ අවසන් කිරීමේ පදය ලියන්න. (ල. 2)
   v. මණ්ඩිය සඳහා විලුඹ දෙක අතර සම්මත දුර ප්‍රමාණය කොපමණද? (ල. 2)

2.
   i. දේශීය නර්තන සම්ප්‍රදායන් නම් කරන්න. (ල. 3)
   ii. ඉන් එක් නර්තන සම්ප්‍රදායක් ප්‍රචලිත ප්‍රදේශ 2ක් ලියන්න. (ල. 3)
   iii. දේශීය නර්තන සම්ප්‍රදායයන් සඳහා භාවිතා කරනු ලබන ප්‍රධාන වාද්‍ය භාණ්ඩය හා ඇඳුම් කට්ටලය නම් කරන්න. (ල. 4)

3.

i. ගැමි නැටුම් හතරක් නම් කරන්න. (ල. 2)

ii. ගැමි නැටුම්වල දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 2)

iii. ගැමි නැටුම් දෙකකට අයත් කවි දෙකක් ලියන්න. (ල. 2)

iv. ඔබ කැමති ගැමි නැටුමක් තෝරාගෙන ඒ සඳහා භාවිතා කරන රංග උපකරණය නම් කර රූප සටහනකින් ඇඳ දක්වන්න. (ල. 4)

4.

i. මාත්‍රා දෙකකට නැටිය හැකි වන්නමක් නම් කරන්න. (ල. 2)

ii. එම වන්නමට අදාල බෙර පදය ලියන්න. (ල. 4)

iii. එයින් නැවත පලතුරින් තුරට පැන ……………….. යන කවිය සම්පූර්ණ කර ලියන්න. (ල. 4)

5.

i. සම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ යනු මොනවාදැයි හඳුන්වන්න. (ල. 2)

ii. සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ දෙකක් හා විකල්ප වාද්‍ය භාණ්ඩ දෙකක් නම් කරන්න. (ල. 4)

iii. විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය සඳහා යොදාගත හැකි ද්‍රව්‍ය 4ක් නම් කරන්න. (ල. 4)